ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2018/04/23 |

## 2018 මාර්තු මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2013=100) විචලනය මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2017 නොවැම්බර් මස සිට අඛණ්ඩව පහළ යන නැඹුරුවක් පෙන්නුම් කළේය. ඒ අනුව, ජා.පා.මි. දර්ශකයෙහි මතුපිට උද්ධමනය ලක්ෂ්‍යමය පදනම මත 2018 පෙබරවාරි මාසයේ පැවති සියයට 3.2 ට සාපේක්ෂව 2016 අප්‍රේල් මස සිට වාර්තා වූ අඩුම අගය වන සියයට 2.8 ක් දක්වා 2018 මාර්තු මාසයේ දී පහළ ගියේය. 2018 මාර්තු මාසයේ දී පැවති සතුටුදායක සැපයුම් තත්ත්ව හේතුවෙන් ආහාර මිල ගණන්වල සිදු වූ මාසික පහළ යෑම 2018 මාර්තු මස ලක්ෂ්‍යමය උද්ධමනයෙහි සිදු වූ මෙම සැලකිය යුතු පහළ යෑමට හේතු විය. වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජා.පා.මි. දර්ශකයෙහි වෙනස 2018 පෙබරවාරි මාසයේ දී වාර්තා වූ සියයට 7.2 සිට 2018 මාර්තු මාසයේ දී සියයට 6.7 දක්වා පහළ ගියේය.

මාසික වෙනස්වීම සැලකූ විට, ආහාර කාණ්ඩයට අයත් අයිතමවල මිල ගණන් පහළ යෑම, විශේෂයෙන් එළවළු, ලොකු ළූණු, සහල් සහ රතු ළූණු මිල ගණන් පහළ යෑම හේතුවෙන් ජා.පා.මි. දර්ශකය 2018 පෙබරවාරි මාසයේ වාර්තා වූ දර්ශක අංක 123.7 සිට 2018 මාර්තු මාසයේ දී දර්ශක අංක 122.8 දක්වා පහළ

ගියේය. මේ අතර, මද්‍යසාර පාන වර්ග සහ දුම්කොළ, ප්‍රවාහන, සහ විවිධ භාණ්ඩ හා සේවා උපකාණ්ඩවල සුළු මිල ඉහළ යෑම් දක්නට ලැබිණි.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන ජා.පා.මි. දර්ශකයෙහි මූලික උද්ධමනය, 2017 සැප්තැම්බර් මාසයේ සිට පෙන්නුම් කළ ආකාරයට තව දුරටත් පහළ යෑමේ නැඹුරුවක් අනුගමනය කරමින් ලක්ෂ්‍යමය පදනම මත 2018 පෙබරවාරි මාසයේ දී පැවති සියයට 2.0 සිට 2018 මාර්තු මාසයේ දී සියයට 1.9 දක්වා පහළ ගියේය. වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2018 පෙබරවාරි මාසයේ දී වාර්තා වූ සියයට 4.1 සිට 2018 මාර්තු මාසයේ දී සියයට 3.6 දක්වා පහළ ගියේය.



# ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම

## පදනම : 2013 = 100

| වසර | මාසය | දර්ශක අගය | | මාසික % වෙනස | | ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) |
| 2016 | ජනවාරි | 112.0 | 113.4 | -1.1 | 0.4 | -0.7 | 3.0 | 2.9 | 4.3 |
| | පෙබරවාරි | 110.8 | 113.9 | -1.1 | 0.4 | 1.7 | 4.6 | 2.6 | 4.4 |
| | මාර්තු | 110.0 | 114.3 | -0.7 | 0.4 | 2.2 | 5.0 | 2.4 | 4.5 |
| | අප්‍රේල් | 111.6 | 115.7 | 1.5 | 1.2 | 4.3 | 5.9 | 2.6 | 4.7 |
| | මැයි | 113.7 | 117.5 | 1.9 | 1.6 | 5.3 | 7.2 | 2.7 | 5.0 |
| | ජූනි | 116.1 | 118.2 | 2.1 | 0.6 | 6.4 | 7.5 | 3.1 | 5.3 |
| | ජූලි | 115.2 | 117.9 | -0.8 | -0.3 | 5.8 | 6.8 | 3.4 | 5.5 |
| | අගෝස්තු | 113.3 | 117.4 | -1.6 | -0.4 | 4.5 | 6.0 | 3.6 | 5.6 |
| | සැප්තැම්බර් | 113.5 | 117.7 | 0.2 | 0.3 | 4.7 | 5.7 | 3.8 | 5.7 |
| | ඔක්තෝබර් | 114.7 | 118.2 | 1.1 | 0.4 | 5.0 | 5.7 | 4.0 | 5.7 |
| | නොවැම්බර් | 116.6 | 120.4 | 1.7 | 1.9 | 4.1 | 6.8 | 4.0 | 5.8 |
| | දෙසැම්බර් | 118.0 | 120.5 | 1.2 | 0.1 | 4.2 | 6.7 | 4.0 | 5.9 |
| 2017 | ජනවාරි | 119.3 | 121.4 | 1.1 | 0.7 | 6.5 | 7.1 | 4.6 | 6.2 |
| | පෙබරවාරි | 119.9 | 122.0 | 0.5 | 0.5 | 8.2 | 7.1 | 5.1 | 6.4 |
| | මාර්තු | 119.5 | 122.3 | -0.3 | 0.2 | 8.6 | 7.0 | 5.6 | 6.6 |
| | අප්‍රේල් | 121.0 | 122.5 | 1.3 | 0.2 | 8.4 | 5.9 | 6.0 | 6.6 |
| | මැයි | 121.8 | 123.0 | 0.7 | 0.4 | 7.1 | 4.7 | 6.1 | 6.4 |
| | ජූනි | 123.4 | 123.1 | 1.3 | 0.1 | 6.3 | 4.1 | 6.1 | 6.1 |
| | ජූලි | 122.4 | 122.9 | -0.8 | -0.2 | 6.3 | 4.2 | 6.2 | 5.9 |
| | අගෝස්තු | 122.3 | 123.0 | -0.1 | 0.1 | 7.9 | 4.8 | 6.5 | 5.8 |
| | සැප්තැම්බර් | 123.3 | 123.1 | 0.8 | 0.1 | 8.6 | 4.6 | 6.8 | 5.7 |
| | ඔක්තෝබර් | 124.8 | 123.1 | 1.2 | 0.0 | 8.8 | 4.1 | 7.1 | 5.6 |
| | නොවැම්බර් | 126.4 | 123.8 | 1.3 | 0.6 | 8.4 | 2.8 | 7.5 | 5.2 |
| | දෙසැම්බර් | 126.6 | 123.8 | 0.2 | 0.0 | 7.3 | 2.7 | 7.7 | 4.9 |
| 2018 | ජනවාරි | 125.8 | 123.9 | -0.6 | 0.1 | 5.4 | 2.1 | 7.6 | 4.5 |
| | පෙබරවාරි | 123.7 | 124.4 | -1.7 | 0.4 | 3.2 | 2.0 | 7.2 | 4.1 |
| | මාර්තු | 122.8 | 124.6 | -0.7 | 0.2 | 2.8 | 1.9 | 6.7 | 3.6 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව